# පුතු සමුගෙන දෙවසරයි

දහ තුන් වසරකට පසු නිමවා දිවි ගමන
සඳ සාමය ලබා පිවිසියෙ සුර විමන
ගුණ සුවඳින් පිරි දිවි පහනක ලෙසින
පුතේ, මල්ලියේ, මිතුරේ තුටු සිතින

සැමද දැනෙනවා සැමතැන ඔබෙ සුවඳ
සොඳුරු සෙනෙහසින් ඔබ සිටි හැටි සුහඳ
කඳුළු මැදින් සිනහ නගන්නට සබඳ
අප සැම සමගින්ම සැරි සරමින් නිබඳ

කෙළිලොල් බවින් සිනහව නිති මුව රන්ද
නිවසේ, පාසැලේ සැම හදවත් බන්ද
විසිරුණු කුසලතා පුබුදු ජය නන්ද
සැනසෙමු අපි, ඔබ සමිඳුන් ළඟ හින්ද

ළබැඳි සැම වෙතින්



දෙව්නක අභිසිත් නදීප ධර්මසිරි